**වාර්තාව (පාර්ලිමේන්තුව තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය - ප්‍රතිලාභ හා පිරිවැය විශ්ලේෂණය) සැකෙවින්**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ලොව වටා ව්‍යවස්ථාදායක දේහයන් හි කටයුතු සඳහා නැතුවම බැරි උපකාරක මෙවලමක් බවට පත් වී තිබේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් ඒවායේ දියුණුවත් සමඟ නීති සම්පාදනය, විධායකයේ කටයුතු අධීක්ෂණය සහ මහජනතාව සමඟ සන්නිවේදනය කිරීම යන පාර්ලිමේන්තුවක වඩාත් වැදගත්ම වගකීම් ඉටු කිරීමෙහි ලා සහාය වීමට අවශ්‍ය නම්‍යශීලීත්වය ලබා ගෙන ඇත.

මෑත වකවානුව තුළ පාර්ලිමේන්තුව සිය කාර්යයන් සඳහා අනුබලයක් ලබා ගැනීමටත් ආයතනය නවීකරණය කිරීම සඳහාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ප්‍රවණතා භාවිතා කිරීම ආරම්භ කර ඇත. රජයේ ආයතනයන් හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපායමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා සහය දීමට 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත මඟින් ස්ථාපිත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නියෝජිතායතනය (ICTA) පාර්ලිමේන්තුවට උපකාර කිරීම සඳහා ඉදිරිපත් විය. තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නියෝජිතායතනයේ අනුග්‍රහය යටතේ, ආයතනයේ විවිධ අවශ්‍යතා සපුරාලන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති 11 කින් සමන්විත ඉ-පාර්ලිමේන්තු ව්‍යාපෘතිය මඟින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපායමාර්ගයක් සකස් කරන ලදී. ඉනික්බිති, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් ඉහත කී උපායමාර්ගය ක්‍රියාවට නැංවීම ආරම්භ කර තිබේ.

මෙවන් සන්දර්භයක් තුළ, මෙම වාර්තාව මූලික වශයෙන් පරමාර්ථ තුනක් හා සබැඳිය:

- පාර්ලිමේන්තුවේ ප්‍රධාන පාර්ලිමේන්තු හා පරිපාලන කාර්යයන් හි හිඩැස් හඳුනා ගැනීම.
- ආයතනයට ගැළපෙන වැඩි දියුණු කිරීම් යෝජනා කිරීම.
- සුදුසු ප්‍රවේශයන් සලකා බලා ඒ අතුරින් පාර්ලිමේන්තුවේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වඩාත් උචිත ප්‍රවේශය පෙන්වා දීම.

**ගැටලු හඳුනා ගැනීම**

ඵලදායිතාවයේ හා කාර්යක්ෂමතාවයේ හිඟයන් කේන්ද්‍රීය කරුණු වුව ද, ප්‍රවේශයේ හා පාරදෘශ්‍යතාවයේ අපහසුව සහ සම්පත් වැයවීම ද ප්‍රධාන කරුණු ලෙස හැඳින්විය හැකිය. බාහිර හා අභ්‍යන්තර ආයතන සමඟ සම්බන්ධ වීමේ අපහසුතා මෙන්ම සන්නිවේදන අපහසුතා, දත්ත හා ක්‍රියාවලි අතිරික්තයන් සහ උපයෝජ්‍යතා ප්‍රශ්න ද වාර්තාව මඟින් හෙළි කරයි. මින් සමහරක් තුළින් දෝෂ ඇතිවීමේ හා දත්ත හානි වීමේ අවදානමක් ද පවතී. තවද, තොරතුරු ලබා ගැනීම, අනාවැකි පළ කිරීම සහ නැඹුරුතා හා රටා පුරෝකථනයට වත්මන් සන්දර්භය උපකාරී නොවන අතර අදාළ පාර්ශ්වකරුවන්හට අප්‍රමාදව තොරතුරු ප්‍රචාරණය වීමද සිදු නොවේ.

**යෝජිත ක්‍රියාවලි වැඩි දියුණුව සහ ප්‍රතිලාභ**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් පාර්ලිමේන්තුවේ කටයුතුවල ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනයක් සිදු කළ හැකිය. එමඟින් අභ්‍යන්තර හා බාහිර පාර්ලිමේන්තු කටයුතු වලට ඍජු බලපෑමක් එල්ල කරමින් තොරතුරු හා සේවාවන් වෙත වඩාත් වැඩි ප්‍රවේශයක් ලබා දීමට පහසුකම් සැලසේ. ඒ අනුව, විධිමත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යා වීමකින් පුනරාවර්තන වියදම් අඩු කර ගත හැකි අතර සේවාවන් හි තත්ත්වය ද උසස් වේ.

මේ අනුව, ආරම්භක වියදම අභ්‍යන්තර හැකියා වර්ධනය කිරීම සඳහා වූ ආයෝජනයක් ලෙස පාර්ලිමේන්තුව විසින් සැලකිය යුතුය. නූතන පාර්ලිමේන්තුවක් කරා යන ගමනේදී, මෙම ආයෝජනය යනු අත්‍යවශ්‍ය පාර්ලිමේන්තු කටයුතු වන සංකීර්ණ ලේඛන සකස් කිරීම හා කළමනාකරණය, පාර්ලිමේන්තු සැසිවාර තුළදී සිදුවන ව්‍යවස්ථාදායක කටයුතු තථ්‍ය කාලීනව වාර්තා කිරීම හා පළ කිරීම සහ පාර්ලිමේන්තුව හා එහි පාර්ශ්වකරුවන් අතර සන්නිවේදනය වැඩි දියුණු කිරීම ආදියට සහාය වීමේ ආයතනික සූදානමයි.

පහත දැක්වෙනුයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ භාවිතාව එහි පාර්ශ්වකරුවනට ලබා දෙන ප්‍රතිලාභ වලින් කිහිපයකි.



1 - PL 003197 - 250 - (2008/09) - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්හට අන්තඃජාලය තුළින් ඕනෑම ස්ථානයක සිට ඕනෑම වේලාවක දී පාර්ලිමේන්තු හා කාරක සභා කටයුතු වලට අදාළ රහස්‍ය තොරතුරු අඩංගු ඉලෙක්ට්‍රොනික දත්ත ගබඩා හා ලේඛන සංචිත වලට ප්‍රවේශ විය හැකිය. තවද, ඔවුන්ට සිය ඡන්දදායකයින් ට සේවය කරමින් සහ ව්‍යවස්ථාදායක කාර්යයන් හා ව්‍යවස්ථාමය කටයුතු වල නියැළෙමින් සිටියදී ම පරිගණක භාවිතා කරමින් පහසුවෙන් පාර්ලිමේන්තුව වෙත ලේඛන යොමු කළ හැකිය. එමෙන්ම ඔවුන්ට ඉලෙක්ට්‍රොනික තැපැල, සංවාද සමූහ, බ්ලොග් සටහන් ආදිය තුළින් මහජනතාව හා අනෙකුත් ආයතන සමඟ සන්නිවේදනය කළ හැකිය.

මහජනතාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය සමඟ අන්තඃජාලය හරහා ඉලෙක්ට්‍රොනිකව සන්නිවේදනය කිරීමට හැකි අතර මෙමඟින් ජනතාවගේ මහජන නියෝජිතයින් පිළිබඳ විශ්වාසය හා ආයතනයේ ප්‍රතිරූපය ඉහළ නැංවෙනු ඇත. ඔවුන්ට පාර්ලිමේන්තු වෙබ් අඩවිය (portal) තුළින් හැන්සාඩ් වාර්තා, සම්මත වීමට නියමිත පනත් කෙටුම්පත්, පනත්, පනත් සංශෝධන, කාරක සභා වාර්තා හා වාර්ෂික වාර්තා ආදිය ද ලබා ගැනීමට හැකිය.

නවීන තාක්ෂණය උපයෝගී කර ගන්නා සන්නිවේදන ජාලයක් මඟින් මහ ලේකම් කාර්යාලයේ සියලු පරිපාලන ඒකක හා කාර්යාංශ එකිනෙක සම්බන්ධ කළ හැකිය. ක්‍රියාවලීන් සමෝධානය කර කෘත්‍යාත්මක මායිම් හරහා හුවමාරු වන තොරතුරු වල නිරවද්‍යතාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය අසීමාන්තිකව තහවුරු කරන ලේඛන හා කාර්ය ප්‍රවාහ කළමනාකරණ පද්ධතියක් මඟින් සියලු දෙපාර්තමේන්තු සම්බන්ධ කළ හැකිය. තවද, අනෙකුත් ආයතනික කාර්යයන් බොහෝ සෙයින් දියුණු කළ හැකි අතර ක්‍රමවත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සමෝධානයක් මගින් සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කළ හැකිය.

**නිර්දේශ**

පාර්ලිමේන්තුවේ අගයන් හා අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට උපකාරී වීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් කළ හැකි දේ සහ මෙතෙක් සිදු කර ඇති දේ අතර විශාල පරතරයක් පවතින බව අධ්‍යයනයෙන් සොයා ගත් තොරතුරු අනුව ප්‍රත්‍යක්ෂ වේ.

මෙවන් සන්දර්භයක් තුළ, බාහිර අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් සිය දුර්වලතා මග හරවා ගැනීමට ආයතනය විසින් පළමුව කටයුතු කළ යුතුය. එමනිසා, වත්මන් දුබල තත්ත්වයේ සිට ඊළඟ තලය වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් බල ගැන්වුණු පාර්ලිමේන්තුවක් දක්වා පරිවර්තනය වීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා පාර්ලිමේන්තුවට ආධාර දෙන්නන්, ජාත්‍යන්තර සංවිධාන සහ විශේෂයෙන්ම අනෙකුත් පාර්ලිමේන්තුවලින් උදව් ලබා ගත හැකිය.

අපේක්ෂිත අරමුණු කරා ළඟා වීම සඳහා පාර්ලිමේන්තුවට අනුගමනය කළ හැකි විකල්ප තුනක් වාර්තාව මඟින් පෙන්වා දේ; ඉන් තුන්වැනි ප්‍රවේශය - උපායමාර්ගික ප්‍රවේශය - ආයතනයේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට නිසැකයෙන් ම උපකාරී වේ. ආයෝජනය හා සසඳා බැලීමේ දී එමඟින් බොහෝ ප්‍රතිලාභ සඳහා පහසුකම් සැලසේ; කෙසේ වෙතත්, ආරම්භක වියදම අභ්‍යන්තර හැකියා වර්ධනය කිරීම සඳහා වූ ආයෝජනයක් ලෙස පාර්ලිමේන්තුව විසින් සැලකිය යුතුය. එමෙන්ම, මෙම ප්‍රවේශය පාර්ලිමේන්තුවේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා ස්ථිර වර්ධනයක් සහතික කරන්නා වූ දෘෂ්ටිකෝණ හතරකින් සමන්විතය.

අපේක්ෂිත ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහාත් ආයතනයේ පාර්ලිමේන්තු හා පරිපාලන කාර්යයන් වලට ඍජුවම සහාය වන තාක්ෂණික යටිතල ව්‍යුහයක් ගොඩ නැංවීම සඳහාත්, ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර නිර්දේශිත ප්‍රවේශයට පක්ෂ පොදු දැක්මක් තිබිය යුතුය.

මෙම ප්‍රවේශය ආයතනයට අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහසුකම් සලසයි. තවද, ප්‍රත්‍යක්ෂ සහ සියුම් ප්‍රතිලාභ රැසක් ලබා දීමට එය සමත් වේ. ඉන් බොහෝමයක් නූතන පාර්ලිමේන්තුවකට අත්‍යවශ්‍ය අංග වේ.